මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# මතුගම අධ්‍යාපන කලාපය

## දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 10 ශ්‍රේණිය | කාලය : පැය 01 යි |
|---|---|---|

**ශිෂ්‍යයාගේ නම :-** ..........................................................................................................................

## I පත්‍රය

- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

1. ඇතැන්ස් පෞර රාජ්‍යයේ ප්‍රධාන පාලන ආයතනය වූයේ,
   - i ගම් සභාවයි.
   - ii රාජ සභාවයි.
   - iii පළාත් සභාවයි.
   - iv පුරවැසි සභාවයි.

2. රාජාණ්ඩු ක්‍රමය වෙනුවට පාලන කටයුතු සම්බන්ධයෙන් ජනතා නියෝජිතයන්ගේ බලය ඉස්මතු කරමින් සිදු වූ විප්ලවය හඳුන්වන්නේ කුමන නමින්ද?
   - i ඇමරිකන් විප්ලවය
   - ii ප්‍රංශ විප්ලවය
   - iii ඉංග්‍රීසි විප්ලවය
   - iv රුසියන් විප්ලවය

3. ඒක පක්ෂ ක්‍රමයක් පවතින රටවල්වලට නිදසුන් සපයන වරණය තෝරන්න.
   - i චීනය, ඇමරිකා එක්සත් ජනපදය, ජපානය
   - ii චීනය, කියුබාව, උතුරු කොරියාව
   - iii ඇමරිකා එක්සත් ජනපදය, බ්‍රිතාන්‍ය, කියුබාව
   - iv චීනය, ප්‍රංශය, ජපානය

4. අතීතයේ සමූහාණ්ඩු පාලන ක්‍රමයක් පැවති ජනපදයක් ලෙස හඳුනා ගත හැක්කේ,
   - i ලංකාවේ අනුරාධපුරය
   - ii ග්‍රීසියේ ඇතැන්ස්
   - iii ඉන්දියාවේ වජ්ජී
   - iv ලංකාවේ පොළොන්නරුව

5. ශ්‍රී ලංකා ජනරජයේ පරමාධිපත්‍ය බලය හිමි වන්නේ,
   - i පාර්ලිමේන්තුවට ය.
   - ii ජනතාවට ය.
   - iii ජනාධිපතිට ය.
   - iv අධිකරණයට ය.

6. ජනාධිපති ආණ්ඩුක්‍රමය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
   - i විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපති විසිනි.
   - ii ජනාධිපති තෝරා ගනු ලබන්නේ ජනතාව විසිනි.
   - iii විධායකය ව්‍යවස්ථාදායකයට සෘජුවම වගකීමට බැඳී ඇත.
   - iv ජනාධිපති රාජ්‍යයේ නායකයා වේ.

7. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක දේශපාලන විධායකය වනුයේ,
   - i රජු හෝ රැජිනයි.
   - ii ජනාධිපතිවරයා ය.
   - iii අගමැති ප්‍රමුඛ අමාත්‍ය මණ්ඩලයයි.
   - iv කථානායකවරයා ය.

8. මැතිවරණයකදී ජනතාවට හිතකර ආණ්ඩුවක් පත් කර ගැනීමේ වැදගත්ම කාර්යභාරය පැවරෙන්නේ,
   - i ඡන්ද කොමසාරිස්වරයාටය
   - ii ඡන්ද දායකයන්ටය
   - iii ඡන්ද අපේක්ෂකයන්ටය
   - iv ඡන්ද ස්ථානාධිපතිවරයාටය

9. බලයේ අවසාන හිමිකරුවා ලෙස හැඳින්විය හැක්කේ,
   - i ජනාධිපතිතුමාය
   - ii මහජනතාවය
   - iii අධිකරණ ඇමතිතුමාය
   - iv අග්‍රවිනිශ්චයකරුය

10. පළාත් සභාවක ප්‍රධාන විධායක නිලධාරියා වන්නේ,
   - i මහ ඇමතිවරයා ය.
   - ii සභාපතිවරයා ය.
   - iii ආණ්ඩුකාරවරයා ය.
   - iv ජනාධිපතිවරයා ය.

11. ආණ්ඩුව සතු ව්‍යවස්ථාදායක, විධායක හා අධිකරණ බලතල එක් මධ්‍යම ආණ්ඩුවකින් පමණක් ක්‍රියාවට නංවන රාජ්‍යයක් වනුයේ,
   - i ඇමරිකා ඒක්සත් ජනපදය
   - ii ඉන්දියාව
   - iii බ්‍රිතාන්‍ය
   - iv ස්විස්ටර්ලන්තය

12. ප්‍රාදේශිය ආණ්ඩු හැඳින්වීමට “කැන්ටන්” යන නම භාවිතා කරන රාජ්‍ය වනුයේ,
   - i ඉන්දියාව
   - ii ස්විස්ටර්ලන්තය
   - iii ඇමරිකා ඒක්සත් ජනපදය
   - iv ප්‍රංශය

13. නූතන රාජ්‍යවල බලය බෙදා හැරිමට බලපෑ හේතුවක් වනුයේ,
   - i සංස්කෘතික විවිධත්වය
   - ii දියුණු ආර්ථික තත්ත්වය
   - iii ජාතීන් සතු නිර්මාණශීලි හැකියාව
   - iv යුධ හා නාවික ශක්තිය

14. නිදහසින් පසුව ලංකාවේ බලය බෙදා හැරිම සඳහා ගත් උත්සාහයකට නිදසුනක් ලෙස දැක්විය හැක්කේ,
   - i ඉන්දු- ලංකා සාම ගිවිසුම
   - ii බණ්ඩාරනායක - චෙල්වනායගම් ගිවිසුම
   - iii L.T.T.E සංවිධානය සමග ඇති කරගත් ගිවිසුම
   - iv සප්තා ගිවිසුම

15. ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ඇති කරනු ලැබුයේ 1978 ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාවේ,
   - i 13 වන සංශෝධනයෙනි
   - ii 19 වන සංශෝධනයෙනි
   - iii 14 වන සංශෝධනයෙනි
   - iv 15 වන සංශෝධනයෙනි

16. බ්‍රිතාන්‍ය පාලන කාලය තුළ ලංකාවේ බලය විමධ්‍යගත කිරිම සඳහා ගත් පියවරක් වනුයේ,
   - i ඩඩ්ලි චෙල්වනායගම් ගිවිසුම අත්සන් කිරීම
   - ii බණ්ඩාරනායක චෙල්වනායගම් ගිවිසුම අත්සන් කිරීම
   - iii 1973 දී දේශපාලන අධිකාරී ක්‍රමය පිහිටුවීම
   - iv 1865 දී මහනගර සභා ආඥා පනත සම්මත කිරිම

17. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වනුයේ,
   - i පාර්ලිමේන්තුව නමිනි.
   - ii සෙනෙට් සභාව නමිනි.
   - iii සන්ධිය මහා මණ්ඩලය නමිනි.
   - iv කොංග්‍රස් මණ්ඩලය නමිනි.

18. ස්විස්ටර්ලන්තයේ සාමූහික විධායකය හඳුන්වනුයේ,
   - i සන්ධිය සභාව නමිනි.
   - ii සන්ධීය මහා මණ්ඩලය නමිනි.
   - iii සෙනෙට් සභාව නමිනි.
   - iv රාජ්‍ය සභාව නමිනි.

19. ලංකාවේ බලය විමධ්‍යගත කිරිමේ කුඩාම ඒකකය ලෙස හැඳින්විය හැක්කේ,
   - i ජාතික මට්ටමයි
   - ii ප්‍රාදේශීය මට්ටමයි
   - iii ග්‍රාම නිලධාරි කොට්ඨාස මට්ටම
   - iv දිස්ත්‍රික් මට්ටම

20. බලය බෙදා හැරිම සිදු කළ යුත්තේ,
   - i පාර්ලිමේන්තු පනත් මගිනි
   - ii ආඥා පනත් මගිනි
   - iii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි
   - iv විදෙස් රටවල උපදෙස් මගිනි

21. රටක සමාජ සාධාරණත්වය ගොඩනැගීම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකයක් ලෙස හැඳින්විය හැක්කේ,

i අල්ලස් හා දූෂණ ඉහළ යාම
ii දේශපාලන ස්ථායිතාව
iii රාජ්‍ය පාලනයේ අකාර්යක්ෂම බව
iv නිලධාරිවාදය

22. "වෙනස්කම තුළින් එකමුතුකම" යන තේමාව යටතේ කටයුතු සිදු කරනු ලබන රටක් නම්,

i ලංකාව
ii ස්විස්ටර්ලන්තය
iii ඇමරිකාව
iv ප්‍රංශය

23. විජය ඇතුළු පිරිස,

i ආක්‍රමණික කණ්ඩායමකි.
ii වෙළඳාමට පැමිණි කණ්ඩායමකි
iii සංක්‍රමණික කණ්ඩායමකි
iv දේශගවේෂන කණ්ඩායමකි

24. බහු සංස්කෘතික සමාජයක සංස්කෘතික සම්මිශ්‍රණය වේගවත් වීමට බලපාන ප්‍රබලම හේතුවක් වනුයේ,

i ඒකම සමාජයක විවිධ ජන කොටස් ජීවත්වීමයි.
ii ලෝකයේ බලවත් රටවල් කුඩා රටවල් ආක්‍රමණය කිරීමයි.
iii ගෝලියකරණය හා සන්නිවේදනයේ දියුණුවයි.
iv කාලයත් සමග ජන සමාජවල ඇති වන වෙනස්වීමයි.

25. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මකවීමෙන් අත්වන වැදගත් ප්‍රතිඵලය වනුයේ,

i ජනවර්ග හා ජන කණ්ඩායම් අතර විශ්වාසය තහවුරු වේ.
ii රාජ්‍ය භාෂා කිහිපයක් භාවිතා කළ හැකි වේ.
iii ගැටුම් වර්ධනය වේ.
iv නීතිය අභිබවා යමින් කටයුතු කිරීමට පුරුදු වේ.

26. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පළාත් සභාවක මහ ඇමතිවරයා ද ඇතුලුව අමාත්‍ය මණ්ඩලය,

i හතර දෙනෙකුගෙන් සමන්විත ය
ii පස් දෙනෙකුගෙන් සමන්විත ය.
iii හය දෙනෙකුගෙන් සමන්විත ය.
iv හත් දෙනෙකුගෙන් සමන්විත ය.

27. රාජ්‍යයේ කැමැත්ත ක්‍රියාවට නංවන නියෝජිතයා ලෙස සලකන්නේ,

i ජනාධිපතිවරයායි.
ii අග්‍රාමාත්‍යවරයායි.
iii ආණ්ඩුවයි.
iv කථානායකවරයායි.

28. බලය විමධ්‍යගත කිරීමේදී දැකිය හැකි විශේෂ ලක්ෂණයක් වනුයේ,

i විවිධත්වය තුළ එක්සත්බ ව ගොඩනගා ගැනීමයි.
ii ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීමයි.
iii බලතල ඕනෑම අවස්ථාවක නැවත පවරා ගත හැකිවීමයි.
iv සියලු තීරණ මධ්‍යම ආණ්ඩුව විසින් ගනු ලැබීමයි.

29. රටක පුරවැසියෙකු සතු මූලික අයිතිවාසිකම් ඇතුළත් කර ඇති ප්‍රධාන ලියවිල්ල වනුයේ,

i දණ්ඩ නීති සංග්‍රහයයි.
ii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි.
iii සමගාමී ලැයිස්තුවයි.
iv සංවෘත ලැයිස්තුවයි.

30. පළාත් ආණ්ඩුකාරවරයා පත් කරනු ලබන්නේ,

i ජනතාවගේ ඡන්දයෙනි.
ii ජනාධිපති විසිනි.
iii පාර්ලිමේන්තුව විසිනි.
iv කථානායක විසිනි.

31. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක නිදහස් මාධ්‍යකින් ඉටු කළ යුතු කාර්යය භාරයක් නොවන්නේ,

i සත්‍ය හා නිවැරදි තොරතුරු ජනතාව වෙත සැපයීම

ii ආණ්ඩු පක්ෂයට පක්ෂපාති වන තොරතුරු සැමවිටම සැපයීම

iii ජනතාවගේ දැනුම වර්ධනය කිරීම

iv කාලීන තොරතුරු ජනතාවට සැපයීම

32. A - විරුද්ධ පක්ෂය සැමවිට ආණ්ඩු පක්ෂයේ ප්‍රතිපත්ති හා ක්‍රියාවන්ට විරුද්ධත්වය දැක්විය යුතුය.

B - විරුද්ධ පක්ෂය ආණ්ඩු පක්ෂය ඉටු කරන යහපත් කටයුතු සාර්ථක කර ගැනීමට සහය විය යුතුය.

ඉහත ප්‍රකාශ අතුරින්,

i A සත්‍ය වන අතර B අසත්‍ය වේ. iii A හා B දෙකම සත්‍ය වේ.

ii A අසත්‍ය වන අතර B සත්‍ය වේ. iv A හා B දෙකම අසත්‍ය වේ.

33. පහත ‘අ ’ තීරුව ‘ආ ’තීරුවට නිවැරදි පිළිවෙලින් ගලපා ඇති පිළිතුර තෝරන්න.

| | අ | ආ |
|---|---|---|
| 1. | ව්‍යවස්ථාදායකය | A. නීති විවිරණය |
| 2. | විධායකය | B. නීති සම්පාදනය |
| 3. | අධිකරණය | C. නීති ක්‍රියාත්මක කිරිම |

i A, B, C ii A, C, B iii B, C, A iv B, A, C

34. මහ නගර සභාවක ප්‍රධාන විධායක නිලධාරියා ලෙස ක්‍රියා කරනුයේ,

i. ආණ්ඩුකරු ය. iii. සභාපති ය.

ii. නගරාධිපති ය. iv. මහ ඇමති ය.

35. රාජ්‍යයෙන් පුරවැසියා කෙරෙහි ඉටු විය යුතු වගකීමක් වනුයේ,

i රාජ්‍ය මූල්‍ය පාලනයේදී විනිවිදභාවයෙන් තොරව කටයුතු කිරීම

ii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමයි

iii රටේ සම්පත් සාධාරණව බෙදා නොදීමයි

iv නීතියට පටහැනිව කටයුතු කිරීමයි

36. යුරෝපයේ බිහි වූ මුල්ම ජාතික රාජ්‍යයන් වනුයේ,

i එංගලන්තය හා ප්‍රංශය iii එංගලන්තය හා ජර්මනිය

ii එංගලන්තය හා ප්‍රංශය iv ප්‍රංශය හා ඉතාලිය

37. ජන හා සංඛ්‍යාලේඛන දත්ත අනුව ලංකාවේ වැඩිම සංඛ්‍යාවක් සිටින ජන වර්ගය හා ආගම වනුයේ,

i ද්‍රවිඩ හා හින්දු iii සිංහල හා බෞද්ධ

ii මුස්ලිම් හා ඉස්ලාම් iv සිංහල හා ක්‍රිස්තියානි

38. පාසල් සිසුවෙකු වශයෙන් ඔබගෙන් ඉටුවිය යුතු යුතුකමක් නොවනුයේ,

i හොඳින් අධ්‍යාපනය ලබා ගැනීම.

ii ගුරුවරුන්ට කීකරුවීම.

iii පාසල සතු පොදු දේපළ රැක ගැනීමෙන් වැලකීම.

iv පාසලේ නීති රීතිවලට ගරු කිරිම.

39. ප්‍රජාතන්ත්‍රවාදී රටක පුරවැසියෙකු සතු යුතුකමක් වනුයේ,

i ගැටුම් ඇති කර ගැනිමයි iii අන්මතවලට ගරු නොකිරීමයි

ii නීතිය හා සාමය ආරක්ෂා කිරීමයි iv අන් සංස්කෘතීන් නොසලකා හැරීමයි

40. රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය හඳුන්වනුයේ,

i සිවිල් නීතියයි. iii අපරාධ නීතියයි.

ii ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි. iv අන්තර් ජාතික නීතියයි.

මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone
மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம் මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம்
මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம மතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம මතුගම අධ්‍යාපන කලාපය
Matugama Education Zone மத்துகம கல்விக் வலயம මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone மத்துகம கல்விக் வலயம මතුගම අධ්‍යාපන කලාපය Matugama Education Zone

# දෙවන වාර ඇගයීම් වැඩසටහන - 2020

| පුරවැසි අධ්‍යාපනය | 10 ශ්‍රේණිය | කාලය : පැය 02 යි |
|---|---|---|

## II පත්‍රය

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුලුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01.

i. ග්‍රීසියේ පැවති පෞර රාජ්‍යයන් දෙකක් නම් කරන්න.
ii. සංස්කෘතියට අයත් වන අංග දෙකක් නම් කරන්න.
iii. ජාතික රාජ්‍ය සංකල්පය පිළිබඳව මත පල කළ දේශපාලන චින්තකයින් දෙදෙනකු නම් කරන්න.
iv. 'වන්නි'මැතිවරණ දිස්ත්‍රික්කයට අයත් වන පරිපාලන දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.
v. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පුරවැසියකු සතු යුතුකම් දෙයාකාරයකට වර්ග කළ හැකි ය. ඒවා නම් කරන්න.
vi. ස්විස්ටර්ලන්ත ව්‍යවස්ථාදායකය සමන්විත වන ආයතන දෙක නම් කරන්න.
vii. විශේෂ පාර්ලිමේන්තු පනත් මගින් පිහිටුවා ඇති අධිකරණ බලය සහිත විශේෂ ආයතන දෙකක් නම් කරන්න.
viii. රාජ්‍යයකට පැවරෙන කාර්යයන් දෙකක් ලියන්න.
ix. ඇමරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු වන බලතල දෙකක් නම් කරන්න.
x. තරගකාරී පක්ෂ ක්‍රමයක යහපත් ලක්ෂණ දෙකක් ලියන්න.

(ල- 2×10=20)

02.

i. ශ්‍රී ලංකාවේ ඡන්ද දායකයන්ට ඡන්දය පාවිච්චි කිරීමට ලැබෙන මැතිවරණ අවස්ථා දෙකක් නම් කරන්න. (ල- 02 )
ii. පාලන ක්‍රමයක් ලෙස සෘජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු තුනක් සඳහන් කරන්න. (ල- 03 )
iii. සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වේ. මෙම ප්‍රකාශය සනාථ කළ හැකි කරුණු තුනක් දක්වා ඉන් එකක් විස්තර කරන්න. (ල- 15 )

03.

i. පළාත් ආණ්ඩුකරු සතු බලතල හා කාර්යයන් 2ක් ලියන්න. (ල- 02 )
ii. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයට අනුව බලතල වර්ගීකරණය කර ඇති ලැයිස්තු 3 නම් කරන්න. (ල- 03 )
iii. ශ්‍රී ලංකාවේ ප්‍රාදේශීය ඒකකවලට බලය විමධ්‍යගත කිරීමේදී මතු වූ ගැටලු තුනක් නම් කර පැහැදිලි කරන්න. (ල- 15 )

04.

i. ශ්‍රී ලංකාවේ බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් නම් කරන්න.
(ල- 02 )

ii. බහු සංස්කෘතික සමාජයක යහපැවැත්ම සඳහා පුරවැසියකු විසින් ප්‍රගුණ කළ යුතු ගුණාංග තුනක් සඳහන් කරන්න. (ල- 03 )

iii. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත්ව කටයුතු කිරීමෙන් අත්පත් කරගත හැකි යහපත් ප්‍රතිඵල දෙකක් නම් කර ඉන් එකක් පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල- 15 )

05.

i. ජාතික රාජ්‍ය බිහිවීම කෙරෙහි බල පෑ හේතු දෙකක් නම් කරන්න. (ල- 02 )

ii. ජාතික රාජ්‍යයක මූලික ලක්ෂණ තුනක් නම් කරන්න. (ල- 03 )

iii. ආණ්ඩුවේ ප්‍රධාන කොටස් තුන නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ල- 15 )

06.

i. සන්ධීය රාජ්‍යයක සාර්ථක පැවැත්ම සඳහා තිබිය යුතු ගුණාංග දෙකක් නම් කරන්න.
(ල- 02 )

ii. සන්ධීය ආණ්ඩු ක්‍රමය පවතින රටවල් දෙකක් නම් කරන්න. (ල- 02 )

iii. සන්ධීය රාජ්‍යයක ලක්ෂණ 3ක් නම් කර ඉන් එකක් කෙටියෙන් පැහැදිලි කරන්න.
(ල- 15)

07.

i. ශ්‍රී ලංකාවේ මැතිවරණයක දී ඡන්දදායකුවීම සඳහා පුද්ගලයකු විසින් සපුරා තිබිය යුතු සුදුසුකම් දෙකක් සඳහන් කරන්න. (ල- 02 )

ii. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් පවතින රටක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව කටයුතු කිරීමෙන් අත්වන ප්‍රයෝජන 3ක් සඳහන් කරන්න. (ල- 03 )

iii. "ප්‍රජාතන්ත්‍රවාදී පාලනයක් සාර්ථකවීම කෙරෙහි ඡන්දදායකයා සතු වගකීම ඉතා වැදගත් වේ." කරුණු තුනක් ඇසුරින් මේ බව පැහැදිලි කරන්න. (ල- 15 )